# පොතමුල ශාන්තිය

පියදාස රණසිංහ

"පොතමුල සාන්තිය" යනුවෙන් නම් කොට තිබූ කවි පණස් දෙකකින් සමන්විත, පත් ඉරු 12 කින් යුතු මේ කුඩා පුස්කොළ පොත මට හමු වූයේ අහම්බෙනි. ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පුස්කොළ පොත් සූක්ෂ්ම සේයා පටවලට පිටපත් කරන අයුරු නරඹන්නට මට පසුගිය දිනෙක අවස්ථාවක් ලැබිණි. පිටපත් කරනු සඳහා සූක්ෂ්ම සේයාපට කැමරාව අසල රැස් කොට තිබූ පුස්කොළ පොත් ගණනාවක් විය. මම ඒවා අතුරින් කුඩා ප්‍රමාණයේ පොත් කිහිපයක් කඩිනම් පිරික්සා බැලීමි. එහි දී අංක "227 7/L. 40" "පොතමුල සාන්තිය" නමැති මේ ග්‍රන්ථය මගේ නෙත ගැටිණි.

මෙබඳු ග්‍රන්ථ නාමයක් කිසිදු පුස්කොළ පොත් නාමාවලියක මා දැක තිබුණේ නැත. එහෙයින් මම එය එතැන දී ම කඩිනමින් කියවා බැලීමි. අනතුරුව කෞතුකාගාර පුස්තකාලයාධිපතිනියට මේ ගැන දන්වා තව දුරටත් තොරතුරු විමසීමි. කෞතුකාගාරයේ ඇති කිසිදු නාමාවලියක හෝ ඩබ්. ඒ. ද. සිල්වාගේ හෝ ජේ. වී. සෝමදාසගේ හෝ නාමාවලින්හි ද මේ ග්‍රන්ථය ගැන කිසිදු සඳහනක් නොවිණි. පුස්තකාලයාධිපතිනියගේ කාරුණික අනුග්‍රහය මත මට එම පොතෙහි ඡායා පිටපතක් ලබා ගත හැකි විය. පසුව තව දුරටත් කෞතුකාගාර පුස්කොළ පොත් එකතුව පරීක්ෂා කොට බැලූ ඇය පිංදනි කවි පොතක කොටසක් ලෙස "පොතමුල සාන්තිය" නම් පත් ඉරු දෙකක් හමු වූ බව මට දැන්වූවාය. එම පොත කලින් හමු වූ පොතෙහි ඇතැම් කවි පමණක් පිටපත් කරන ලද්දක් බව එය පිරික්සා බැලීමේ දී පැහැදිලි විය.

ග්‍රන්ථයේ කතුවරයා ගැන හෝ පිටපත්කරු ගැන හෝ කිසිදු සඳහනක් මුලින් හමු වූ පිටපතෙහි නොවිණි. කෙසේ වෙතත් පසුව හමුවූ අසම්පූර්ණ පිටපතෙහි 'විලච්චිය කෝරළෙන් ලැබුණු පොතක පිටපතයි. ලියා නිම කළේ 1897.9.29 දින දී ය." යනුවෙන් සඳහන් වේ. මේ දිනයත්, පළමු ග්‍රන්ථයේ ඇති අකුරු, බස්වහර හා පද විලාසයත් සැලකිල්ලට ගත් විට මුල් කෘතිය 18 වැනි සියවසේ පමණ රචනා වන්නට ඇතැයි සිතිය හැකි ය.

මෙහි වෙනත් පිටපත් සොයා ගත හැකි දැයි විහාරාරාම ගණනාවක් පිරික්සා බැලුව ද එවැන්නක් සොයා ගත නොහැකි විණි. ඇතැම් විට මතු මත්තෙහි එවැන්නක් හමුවීමට ඉඩ ඇත. ග්‍රන්ථයේ යථා සෝධනයක් කළ හැකි වන්නේ එසේ පිටපත්